ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2086/42 - 2018 අගෝස්තු මස 31 වැනි සිකුරාදා - 2018.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* අඹකෝ/3/4/අ/89.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ යොමු අංකය:* 13/99/E/61.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් උතුර ග්‍රාම නිලධාරි වසමේ හැටන් දික්ඔය නගර සීමාව තුළ පිහිටි, හැටන් වත්ත නැමැති ඉඩමේ නුවරඑළිය ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සකස් කරන ලද 2018.02.26 දිනැති මු.පි.නු. 3099හි කැබලි අංක 1 වශයෙන් සඳහන් හෙක්ටයාර 0.8077 පමණ වූ ඉඩම් කොටස;

01. **කැබලි අංක 1 - හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.8077;**

*මායිම්:*

උතුරට: ඇළ;නැගෙනහිරට: ඇළ සහ හැටන් වත්ත; දකුණට: හැටන් වත්ත, මු.පි. මහ 763හි කැබලි අංක 1 සහ හැටන් වත්ත; බටහිරට: හැටන් වත්ත සහ ඇළ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018 ඔක්තෝබර් මස 17 වැනි දින ප.ව. 2.00 ට අඹගමුව බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 ඔක්තෝබර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ආර්.ටී.පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2018 අගෝස්තු මස 28 වැනි දින,
අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
09-406